# ඉන්දීය පුරවිද්‍යා නීතිය හා දේශීය පුරාවිද්‍යා නීතිය (පුරාවිද්‍යා ස්ථාන රූගත කිරීම, ඡායාරූප ගැනීම සම්බන්ධ නෛතික තත්ත්වයන් පිළිබඳ අධ්‍යයනයක්)

**වාසනා සිරිමල්වත්ත**
ශ්‍රී ලංකා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත, කොළඹ.
wsirimalwatte@gmail.com

ප්‍රමුඛ පද : පුරාවිද්‍යා නීතිය, පුරාවස්තු ආරක්ෂා කර ගැනීම

**හැඳින්වීම**

වර්තමානයේ ලොව බොහෝ දේශයන් සිය සංස්කෘතික හා පුරාවිද්‍යාත්මක උරුමය ආරක්ෂා කර ගැනීම සඳහා මහත් උත්සහයක් ගන්නා බව පෙනේ. මෙහි දී අපගේ අධ්‍යයනයට පාදක වූයේ ඉන්දීය පුරාවිද්‍යා සමීක්ෂණ දෙපාර්තමේන්තුව එහි පුරාවිද්‍යාත්මක උරුමය රැක ගැනීම සඳහා භාවිතයට ගන්නා, 1958 වර්ෂයේ බිහි වූ "පුරාණ ස්මාරක, පුරාවිද්‍යාත්මක ක්ෂේත්‍ර සහ පුරාවිද්‍යාත්මක ශේෂ පනත" සම්බන්ධවයි (Ancient, Monuments and Archaeological sites and Remaince Act 24 of 1958). එම පනතේ අට වැනි පරිච්ඡේදයේ සඳහන් ආරක්ෂිත ස්මාරක පිටපත් කිරීම හා රූගත කිරීමට (Cpopying and filming of protected Monuments – Chapter VIII) අදාළ නීතිමය තත්ත්වයන් පිළිබඳ ව මෙහි දී ප්‍රධාන වශයෙන් සාකච්ඡා කිරීමට බලාපොරොත්තු වේ. ලාංකේය පුරාවිද්‍යා නීතියේ පුරාවිද්‍යා ස්ථාන රූගත කිරීම්, ඡායාරූප ගැනීම සම්බන්ධ නෛතික තත්ත්වයන්ගේ ස්වභාවය හඳුනාගැනීම ඉන්දීය නෛතික තත්ත්වයන් හා සන්සන්දනය කිරීම මෙහි දී සිදු වේ.

පුරාවිද්‍යා උරුමය රැකගැනීමේ කාර්යය සාර්ථක වන්නට නම් ශක්තිමත් නීති සම්පාදනය කර තිබිය යුතුය. එරට පුරාවිද්‍යාත්මක හා සංස්කෘතික උරුමය ඉන්දීය නීති පද්ධතිය මගින් මෙසේ වර්ග කර ඇත.

1. පුරාණ ස්මාරක (Ancient Monuments)
2. පුරාවිද්‍යා ක්ෂේත්‍ර (Archaeological Sites)
3. පුරාවස්තු (Antiquities)
4. කලා නිධාන - උරුම (Art Treasures)

මෙහි ප්‍රථම කොටස්ද්වය නිශ්චල උරුමයන්ට (Immovable Properties) අයත්වන අතර අනෙකුත් කොටස් චංචල උරුමයන්ට (Movable

Properties) අයත් වේ. බිස්වාස් පෙන්වා දෙන පරිදි නීතියේ ආරක්ෂාව ලබා දීමට නම් ස්මාරක, ජාතික වැදගත්කමක් ඇති අංග ලෙස නම් කළ යුතු ය (Biswas 1999: Introduction).

**පුරාණ ස්මාරක, පුරාවිද්‍යාත්මක ක්ෂේත්‍ර සහ පුරාවිද්‍යාත්මක ශේෂ පනත (The Ancient Monuments and Archaeological Sites and Remains Act, 1958)**

මෙය පැරණි හා ඓතිහාසික ස්මාරක සඳහා ආරක්ෂාව සැලසීමටත්, පුරාවිද්‍යා කැනීම්වලට සහ ප්‍රතිමා, කැටයම් සහ වෙනත් එවැනි වස්තූන් ආරක්ෂා කිරීමත් සඳහා වූ පනතකි. මෙය ඉන්දියාවට ම බලපාන පනතක් ලෙස පිළිගත්ත ද පනතේ අංක 22, 24, 25 සහ 26 කොටස් ජම්මු සහ කාශ්මීර් ප්‍රාන්තවලට අදාල නොවන බව සඳහන් වේ.

මෙම පනතේ පළමුවැනි කොටසේ එහි කෙටි නාමය, ආවරණයවන කලාප සහ බලගැන්වෙන ආකාරය ගැන සඳහන් වේ. දෙවැනි කොටසේ සඳහන් වන්නේ නිර්වචන (Definitions) පිළිබඳවය. ඒ අනුව,

a. කුමන හෝ ඉදිකිරීමක්, ගොඩනැගිල්ලක් හෝ ස්මාරකයක් හෝ ඕනෑම සොහොන් ගොඩැල්ලක්, සුසානයක් (Burial) හෝ ඕනෑම ලෙනක්, ලෙන් ආවරණයක් (Rock Shelter), අභිලේඛයනයක් හෝ ඓතිහාසික, පුරාවිද්‍යාත්මක හෝ කලාත්මක අගයක් හෝ උනන්දුවක් ඇති, එමෙන්ම වසර සියයකට පෙර සිට පැවත එන පහත සඳහන් අංග මෙහි පැරණි ස්මාරක (Anceint Monuments) ලෙස නිර්වචනය කර ඇත.

I. පැරණි ස්මාරකයක ශේෂ
II. පැරණි ස්මාරකයකට අයත් ක්ෂේත්‍රය (භූමිය)
III. පැරණි ස්මාරකයකට යාබදව ඇති එම ස්මාරකයේ ආරක්ෂාවට හේතුවන, එම ස්මාරකයක වටා ආරක්ෂාව පිණිස වැටක් හෝ ආවරණයක් ඉදිකිරීම අවශ්‍යවන බිම් කොටස

b. පුරාවස්තු (Antiquities) ලෙස,

I. ඕනෑම කාසියක්, මූර්තියක්, ලියවිල්ලක්, අභිලේඛනයක් හෝ අනෙකුත් කලාත්මක නිර්මාණයක්
II. ඕනෑම වස්තුවක් හෝ යම් දෙයක්, ගොඩනැගිල්ලකට හෝ ලෙනකට සම්බන්ධවන කැඩී බිඳී ගිය ඕනෑම දෙයක්, යම් වස්තුවක්
III. අතීත කාලයට අයත් විද්‍යාත්මක, කලාත්මක, සාහිත්‍යමය, ආගමික, චාරිත්‍ර, පිළිගැනීම් හෝ දේශපාලන අංශයන් නිරූපණය කරන කිසියම් වස්තුවක් හෝ දෙයක්
IV. ඓතිහාසික ලක්ෂණ නිරූපණය කරන ඕනෑම් වස්තුවක් හෝ දෙයක්

V. මධ්‍යම ආණ්ඩුව මගින් මෙම පනතට අවශ්‍ය වන පරිදි නිල ගැසට් නිවේදනයක් මගින් ප්‍රකාශයට පත් කරන ලද ඕනෑම වස්තුවක් හෝ ඕනෑම දෙයක් පුරාවස්තුවක් ලෙස අර්තකථනය කර ඇත.මේ සමග වසර සියයකට අඩු නොව කාලයක සිට පැවත එන වස්තුවක් යන වගන්තිය ද ඇතුළත් කර ඇත

මෙම පනතේ වගන්ති තිස් නවයක් අඩංගු වේ. 1958 වර්ෂයේ මෙම පනතට අදාල වන පරිදි 1959 දී මධ්‍යම ආණ්ඩුව මගින් නීති හඳුන්වා දී ඇත (The Ancient Monuments and Archaeological Sites and Remains Rules, 1959). මෙම නව නීති අතුරින් අපගේ අධ්‍යයනය පිණිස යොදා ගත්තේ 1958 අංක 24 දරන පනතේ පරිච්ඡේද VIIIටඅයත් ආරක්ෂිත ස්මාරක පිටපත් කිරීම හා රූගත කිරීමට (Copying and Filming of Protected Monuments)අදාළව සකස් වූ නීතියයි. එයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ ලංකාවේ මෑත කාලීනව පුරාවිද්‍යා ස්ථාන, ස්මාරක හෝ ඊට අදාළ භූමිය සම්බන්ධ ඡායාරූප ගැනීම, චිත්‍රපට හා වාර්තා වැඩසටහන් සඳහා කෙරෙන රූගත කිරීම් බහුල වශයෙන් සිදු වීමත්, එහි දී පුරාවිද්‍යා උරුමයට හානිවන ක්‍රියාකාරකම් සිදු වීමත් යන කරුණුය. උක්ත පනතේ අදාළ නෛතික වගන්ති ආරම්භ වන්නේ 40 වැනි වගන්තියෙන් වන අතර 48 වැනිවගන්තිය දක්වා කොටස් මෙම විෂයට අදාල වේ.

**40 - ඇතැම් ස්මාරක පිටපත් කිරීම සඳහා අවශ්‍ය අනුමැතිය ලබා ගැනීම. (Permission Required for Copying Certain Monuments)**

පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල් විසින් බලය දෙන ලද පුරාවිද්‍යා නිලධාරියෙකු හෝ එසේ බලය ඇති පුරාවිද්‍යා නිලධාරියෙකු විසින් පත්කරන ලද නිලධාරියෙකු විසින් කොන්දේසි සහිතව ලිඛිතව දෙන ලද අනුමැතියකින් ඇතැම් ස්මාරක හෝ එහි කොටසක් පිටපත් කිරීම හෝ රූ ගත කිරීම සිදු කළ හැකිය.

**41 අනෙකුත් ස්මාරක පිටපත් කිරීම සඳහා වන කොන්දේසි (Conditions of copying other monuments)**

අංක 40 යටතේ පුරාවිද්‍යා ස්මාරකයක් පිටපත් කිරීමට අවසර ලබා ගත් පුද්ගලයෙකුට,

(a) අදාළ ස්ථානයට හෝ ස්මාරකයට අදාළ භූමියට කැමරා රඳවන, බංකු, පුටු, මේස, විශාල පිටපත් කිරීමේ පුවරු, කැන්වස් ධාරක (චිත්‍ර රඳවා ගන්නා ලෑලි රාමු) හෝ එවැනි භාණ්ඩ

(b) එවැනි භාණ්ඩ කිසියම් ආකාරයකට (සිරස්) සිටුවීම

(c) කෘත්‍රිම ආලෝකයක් හෝ කැමරා මගින් ආලෝකය නිකුත් කිරීම

(d) ස්මාරකයට හෝ එහි කොටසක් සඳහා ජලය, තෙල්, ග්‍රීස් හෝ කිසියම් අන්දමක සවි කිරීමේ

ද්‍රව්‍යය යොදා ගැනීම. පනවා ඇති නීතිමය තත්ත්වයන්ට අනුකූලව මේ සඳහා පූර්ව අනුමැතිය ලබා ගත යුතුය.

**43 බලපත්‍රය සඳහා වන අයදුම් පත්‍රය (Application for liecens)**

ආරක්ෂිත ස්මාරකයක් රූගත කිරීමට අපේක්ෂා කරන ඕනෑම පුද්ගලයෙකු අංක IX (පිටු අංක 08) අයදුම් පත්‍රය මගින් ඔහුගේ කාර්යය අරඹන දිනයට අවම වශයෙන් මාස තුනකට ප්‍රථම පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කර බලපත්‍රයක් ලබාගත යුතුය.

**44. බලපත්‍රය ලබා දීම හෝ අවලංගු කිරීම (Grant or refusal or licence)**

අංක 43 යටතේ දක්වා ඇති පරිදි බලපත්‍රයක් සඳහා අයදුම් කරන පුද්ගලයෙකුට හෝ ආයතනයකට ඉන්දීය රුපියල් 5,000ක අය කිරීමක් මත අධ්‍යක්ෂ ජනරාල් විසින් අවසරය ලබා දෙනු ලැබේ.

මෙම බලපත්‍රය ලබා දීම පිළිබඳව සෑහීමකට පත් නොවන අවස්ථාවක එය ප්‍රතික්ෂේප කිරීමට ද අධ්‍යක්ෂ ජනරාල්ට බලය ලබා දී ඇත.

45. 44 වන වගන්තිය යටතේ ලබා දෙන ලද බලපත්‍රය, එහි කිසියම් හෝ කොන්දේසියක් උල්ලංඝනය කර ඇති බව අධ්‍යක්ෂ ජනරාල්වරයාට අවබෝධ වුවහොත්, පූර්ව දැනුම් දීමකින් අනතුරුව මෙම බලපත්‍රය අවලංගු කළ හැකිය.

**46. අභියාචනය**

තම වැනි බලපත්‍ර අවලංගු කිරීමකට විරුද්ධ වන යම්කිසි පුද්ගලයෙකු වෙතොත් ඔහුට මධ්‍යම ආණ්ඩුවට අභියාචනයක් ඉදිරිපත් කළ හැකි අතර එවැනි අභියාචනයක් සඳහා මධ්‍යම ආණ්ඩුවේ තීරණය අවසන් තීරණය වේ.

**48. දඬය**

මෙම පරිච්ඡේදයේ නීති උල්ලංඝනය (Contravention) කරමින්, යම් පිටපත් කිරීමක් රූගත කිරීමක් හෝ රංගනයක් සිදුකරන්නේ නම් ඒ සඳහා රුපියල් පන්සියය දක්වා දඩයක් (Penalty) අය කරගැනීමට කටයුතු යොදා ඇත.

**ගැටලු/යෝජනා/විසඳුම්**

මෙම පනතේ නෛතික තත්ත්වයන්ට අනුකූලව කටයුතු කිරීමේ දී ඉන්දීය පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව ප්‍රායෝගිකව මුහුණ දුන් තත්ත්වයන් හා ඒ සම්බන්ධව ගත් පියවර කිහිපයක් මෙහි දී සාකච්ඡා කිරීම බෙහෙවින් වැදගත් වේ යැයි අදහස් කරමි. මෙහි දී ප්‍රධාන නිදසුනක් ලෙස අපගේ අවධානය යොමු වන්නේ ඉන්දියාවේ දිල්ලි අගනුවර අතිශය වැදගත් පුරාවිද්‍යා ස්මාරකයක් වන " **රතු කොටුව"** (Red Fort) කේන්ද්‍රකරගෙන කරන ලද රූගත කිරීමක් සම්බන්ධවයි. පෝලියෝ රෝග දරුවන් වෙනුවෙන් ඉන්දීය සුපිරි නළුයෙකු වන අමීර් ඛාන් යොදවාගෙන කළ එම රූගත කිරීම නැරඹීමට දහස් සංඛ්‍යාත ජනකායක් එහි රැස්ව සිටියහ.

ඉන්දියාවේ පවතින ඓතිහාසික බලකොටු අතුරින් අතිශයින් විශාල බලකොටුවක් ලෙස රතු බලකොටුව හැඳින්විය හැකිය. 2007 වර්ෂයේ යුනෙස්කෝව මගින් ලෝක උරුම ස්ථානයක් ලෙස නම් කළ මෙය මෝගල් අධිරාජ්‍යයෙකු වූ ශාජහාන් රජුගේ අගනගරය වූ ශාජහනාබාද් හි ඇතුළු නුවර වන්නේය. මෙම අධිරාජයා යටතේ මෝගල් වාස්තු විද්‍යාව උත්කෘෂ්ඨ තත්ත්වයකට පත් වූ අතර, ඒ සඳහා දැක්විය හැකි හොඳම නිදසුනක් ලෙස මෙම රතු බලකොටුව හැඳින්විය හැකි ය. පසු කාලීන බලකොටු නිර්මාණයේ දී ආදර්ශයක් ලෙස සැලකූ මෙය ඉස්ලාමීය පිළිගැනීම් පදනම් කර ගනිමින් පර්ශියානු, හින්දු ආදී විවිධ සම්ප්‍රදායන් දායක කර ගනිමින් කළ අපූර්ව නිර්මාණයකි.

එවැනි අතිශය වැදගත් පුරාවිද්‍යාත්මක උරුම ස්ථානයක මෙ වැනි රූගත කිරීමක් සඳහා ඉන්දීය පුරාවිද්‍යා සමීක්ෂණ දෙපාර්තමේන්තුව මගින් අවසරය ලබා දී තිබුණේ එය ජාතික වැදගත්කමක් ඇති දැන්වීමක් වූ බැවිනි. එහි දී සෙනඟ පාලනය කිරීම බෙහෙවින් අසීරු කටයුත්තක් වුව ද එම පුරාවිද්‍යා පරිශ්‍රය භාරව කටයුතු කළ නිලධාරින් මැනවින් සෙනඟ පාලනය කරමින් එම ස්මාරකයේ ආරක්ෂාව සඳහා කටයුතු කළ ආකාරය දැකගත හැකි විය.

රූගත කිරීම්, පිටපත් කිරීම් සඳහා පුරාවිද්‍යා සමීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත බාරදෙන පිටපත් අධ්‍යයනය කරනු ලබන්නේ පුරාවිද්‍යා අධිකාරිවරයෙකි (Supirintandant of Archaeology). අනතුරු ව පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල් වෙනුවෙන් ඔහු අනුමැතිය ලබා දීම සිදු කරන අතර එක් ස්මාරකයකට ඉන්දීය රුපියල් පන්දහසක් අය කෙරේ. මේ මගින් ඉන්දීය පුරාවිද්‍යා සමීක්ෂණ දෙපාර්තමේන්තුවට සැලකිය යුතු ආදායමක් ලබා ගැනීමට හැකියාව ලැබී ඇත.

මෙරට පුරාවිද්‍යා ස්මාරක රූගත කිරීම, පිටපත් කිරීම හෝ ඡායාරූප ගත කිරීමේ කාර්යයන් සඳහා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව කිසිදු මුදලක් අය නොකෙරේ. මෙවැනි කාර්යයන් සඳහා එම දෙපාර්තමේන්තුව වෙත ඉල්ලුම්පත් රැසක් ලැබේ. එම ඉල්ලුම්පත් අනුව එම රූගත කිරීම් සඳහා ස්මාරකයක් වෙනුවෙන් කිසියම් මුදලක් අය කිරීමට යාන්ත්‍රණයක් සකස් කිරීම සුදුසුය. එම ආදායම මෙරට පුරාවිද්‍යා ස්මාරක නඩත්තුව, සංරක්ෂණය සඳහා යොදා ගත හැකිය.

රූගත කිරීම් සිදු කිරීමේ දී අදාළ ස්මාරකය නියම නමින් ම අදාළ නිර්මාණයට ඇතුළු කළ යුතු අතර එය වෙනත් ස්ථානයක් ලෙස නම් කිරීම සපුරා තහනම් වේ.
උදා : රතු කොටුව තුළ ඇති, දිල්ලි ගේට්ටුවේ ඇති ඇතුන් සහිත ද්වාරය හෝටලයක ඇති දොරක් ලෙස නම් කළ නොහැකිය.

ඉන්දීය චිත්‍රපට රූගත කිරීමේ දී බොලිවුඩ් රංගන ශිල්පීන් දැකබලා ගැනීම සඳහා මහජනයා විශාල වශයෙන් රැස්වේ. පුරාවිද්‍යා ස්මාරක බහුල ව ඇති ඉන්දියාවේ මේ වැනි අවස්ථාවල මහජනයා ප්‍රාකාර අසල ඒකරාශි වීම, පැරණි ස්මාරකවල බැම්මත නැගීම ආදිය සිදු වේ. මෙමගින් පුරාවිද්‍යා පරිශ්‍රයන්ට හා ස්මාරකයන්ට වන හානිය බරපතල ය.

එරට ඇති වැදගත් පුරාවිද්‍යා ස්ථානයක් වන ක්‍රිස්තු පූර්ව යුගයට පවා දිවෙන ඉතිහාසයක් සහිත ප්‍රදේශයක පිහිටි අක්බර් රජු විසින් පිහිටුවන ලද මධ්‍ය කාලීන නගරයක ඇති Fathepur Sikiri පුරාවිද්‍යා ස්ථානයට එසේ මහජනයා රැස්වීම නිසා හානි සිදු වී තිබුණි. තවත් අවස්ථාවක රාජස්ථානයේ ජායිපූර්හි පැරණි මාළිගයක (Amir Palace) සිදු කරන ලද රූගත කිරීමක දී විශාල වශයෙන් මහජනයා රැස්වූ අතර එහි බිත්තියක කොටසක් විනාශයට පත් විය. එහි දී වහා ම අවශ්‍ය නෛතික පියවර ගැනීමට ඉන්දීය පුරාවිද්‍යා සමීක්ෂණ දෙපාර්තමේන්තුව කටයුතු කරනු ලැබීය.

ඊට සාපේක්ෂව මෙරට තත්ත්වය පිළිබඳව විමසා බලන විට මෑතක දී ඇතැම් ටෙලිනාට්‍ය රූගත කිරීම්වල දී පුරාවිද්‍යා ස්මාරක අසල හෝ පරිශ්‍රවල විවිධ රූගත කිරීම්වලින් අනතුරුව තාවකාලිකව ගොඩනගන දේ දමා යෑම, එසේ යම් යම් ඉදිකිරීම්වල දී පුරාවිද්‍යා ස්ථානවලට විවිධ හානි සිදුවීම හඳුනාගත හැකිය. ඇත ඉතිහාසයකට හිමිකම් කියන මෙරට පුරාස්ථාන වෙනත් ස්ථාන ලෙස නම් කරමින් කෙරෙන රූගත කිරීම් ද වර්තමානයේ බහුලය.

ඉන්දීය පුරාවිද්‍යා සමීක්ෂණ දෙපාර්තමේන්තුවට මේ සම්බන්ධයෙන් තවත් ගැටළු මතු වී ඇත. එක් අවස්ථාවක චිත්‍රපට අධ්‍යක්ෂවරුන් ඉදිරිපත් කරන පිටපත තවත් අවස්ථාවක වෙනස්කම් වලට භාජනය කළ ද ඒ වෙනස්කම් දක්වමින් නැවත බලපත්‍රයක් ලබා නොගැනීමත් තවත් එක් ගැටළුවකි.

තවත් සමහර අවස්ථාවල කිසිදු බලපත්‍රයක් ලබා නොගෙන රූගත කිරීම් සිදුකළ අවස්ථාද අනාවරණය වී ඇති බව සම්මුඛ සාකච්ඡාවලදී හඳුනාගත හැකි විය. මෙවැනි අවස්ථා මෙරට පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට ද වර්තමානයේ නිතර අත්දකින්නට සිදු වේ.

කුමන ආගමකට හෝ අයත් දැනට ජීවමාන ලෙස වන්දනාමාන කරන ස්මාරකවල රූගත කිරීම් සිදු කිරීමට අවසර නොමැති වුවත් එවැනි ස්ථානවල ද රූගත කිරීම් සිදු කරනු ලබයි.
නිදසුන් : ශිව ලිංගය තැන්පත් කර ඇති දැනට වන්දනයට බඳුන්වන ස්ථානයක නැටුම් දර්ශනයක් රූගත කරන්නට කිසිවිටෙක අවසර නොදේ.

මෙරට පුරාවිද්‍යා නීතියේ දැනට භාවිතයට ගන්නා ප්‍රධාන පනත වන්නේ 1940 අංක 09 දරන පුරාවස්තු

ආඥා පනතයි. එය 1998 අංක 24 දරන පනත මගින් සංශෝධනයට ලක් කර ඇත.

මෙහි යම් යම් නීති, 2005 අංක 12 දරන දඩ මුදල් වැඩි කිරීමේ පනතින් සංශෝධනයට ලක් වූ අතර දැනට ඒ අනුව, පුරාවස්තු විනාශ කිරීමට අදාල දඩය හා සිර දඬුවම යන දෙකම මේ යටතේ වැඩි කර ඇත. එ පමණක් ද නොව 2005 වර්ෂයෙන් පසු මේ පනතින් සමහර නීති සංශෝධනය සඳහා වරින් වර යෝජනා ඉදිරිපත් කර තිබේ.

උක්ත ප්‍රධාන පනතේ අපගේ අවධානයට ලක්වන පුරාවිද්‍යා ස්ථාන ඡායාරූප ගැනීම, වීඩියෝ ගත කිරීම සම්බන්ධයෙන් සෘජුව ම සකස් කළ පරිච්ඡේද හෝ වගන්ති අඩංගු නොවේ.

වත්මන් ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යා ස්මාරක හා ක්ෂේත්‍ර පසුබිම් කරගනිමින් නිර්මාණය කෙරෙන චිත්‍රපට, ටෙලි නාට්‍ය, වාර්තා වැඩසටහන් බහුල ය. ඓතිහාසික තොරතුරු හෝ කරුණු පදනම් කරගෙන ඓතිහාසික ස්ථානයක මෙවැනි කලාත්මක නිර්මාණ සිදු කිරීම අද්‍යතනයේ ප්‍රවනතාවක් ව පවතී. එපමණක් ද නොව බොහෝ ඓතිහාසික ස්ථාන, මංගල ඡායාරූප සඳහා යොදා ගැනීමේ ප්‍රවනතාවක් වර්තමානයේ පවතී. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ප්‍රවර්ධන අංශය වෙත සතියකට දළ වශයෙන් මෙවැනි ඉල්ලුම්පත් 60-70 ප්‍රමාණයක් ලැබේ.

ඒ නිසාම මෙ රට පුරාවිද්‍යා ස්මාරක ඡායාරූපගත කිරීම, වීඩියෝගත කිරීම, සම්බන්ධ සෘජු ලෙස ම සකස් කරන නීති වර්තමානයේ අත්‍යවශ්‍යයෙන් ම පැවතිය යුතු ය.

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මගින් මේ කාර්යය සඳහා කොන්දේසි ඇතුළත් අවසර පත්‍රයක් සකස් කර ඇත (පිටු අංක 09). නමුත් අනවසර රූගත කිරීමක් සඳහා අය කරනු ලබන දඩය, ඒවායෙහි දඬුවම් වෙන්වෙන් ව (විස්තර කිරීමක්) දක්වා නොමැත. පුරාස්ථාන රූගත කිරීම, ඡායාරූප ගැනීම සඳහා ඉල්ලුම් කිරීමේ බලපත්‍රය ලබා ගැනීම සඳහා දැන් පවතිනවාට වඩා විධිමත් ක්‍රමයක් සකස් කිරීම යුගයේ දැඩි අවශ්‍යතාවක් ව පවතී.

මෙම ආකෘති පත්‍රයේ අංක2 සිට අංක 11 දක්වා කොන්දේසි දක්වා ඇත. එසේ ම එහි අංක 6 කොන්දේසිවල සඳහන් කර ඇත්තේ 1940 වර්ෂයේ ප්‍රධාන පුරාවස්තු ආඥා පනතේ අංක 45 සිට 48 දක්වා රෙගුලාසි වලට මෙම බලපත්‍රය යටත් වන බවය. එපමණකින් නොනැවතී මෙම නීති විග්‍රහ කර දඩය පැහැදිලි ව සඳහන් කිරීම බෙහෙවින් වැදගත් බව මෙම බලපත්‍ර නිකුත් කිරීමේ රාජකාරි වල යෙදීමේදී මැනවින් වටහාගත හැකි විය. බොහෝ විට මෙවැනි ඉල්ලුම්පත් ඉදිරිපත් කරනු ලබන්නේ සාමාන්‍ය ජනතාව වන බැවින් ඔවුන්ගේ මනසට ගෝචරවන පරිදි මේවා පැහැදිලි ව දැක්වීම අතිශයින් ම වැදගත් ය.

පිටපත ඉදිරිපත් කර එය අධ්‍යයනය කිරීමට, අඩුපාඩු පිරික්සීමට අදාළ නිලධාරින්ට සාධාරණ කාලයක් ලබා දීම බෙහෙවින් වැදගත්ය. එමගින් නුසුදුසු දර්ශන, අපැහැදිලි කරුණු හඳුනා ගන්නටත්, ඒවා ඉල්ලුම්කරුට දැනුම් දී අවශ්‍ය සංශෝධන සිදු කිරීමටත්, එසේ නොවන්නේ නම් බලපත්‍රය නිකුත් නොකිරීමට තීරණ ගැනීමටත් පුරාවිද්‍යා නිලධාරින්ට අවස්ථාව උදා වේ. එමගින් සිදු වන්නේ මතු පරපුර උදෙසා අපගේ පුරාස්ථාන ආරක්ෂා කර ගැනීමට හැකියාව ලැබීමයි.

මෙම කාර්යය සඳහා අයදුම් කරන පුද්ගලයින්ට එම අයදුම් පත්‍රය දෙපාර්තමේන්තු වෙබ් අඩවිය මගින් ලබා ගන්නට අවස්ථාව උදා කර දීම ද මෙහි දී වැදගත් වේ. එසේ වන්නේ එවිට දේශීය පුද්ගලයන්ට පමණක් නොව විදේශීය පුද්ගලයන්ට ද පහසුවෙන් ඒ සඳහා අයදුම් කළ හැකි වීමයි. එම ඉල්ලීම අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කර උපදෙස් ලබා ගැනීමටත්, විෂයට අදාළ අධ්‍යක්ෂවරයාට මේ පිළිබඳ ව සොයා බලා බලපත්‍රය නිකුත් කිරීමට හෝ නොකිරීම සම්බන්ධ තීරණ ගැනීමට අවම වශයෙන් සති දෙකක පමණ කාලයක් ලබා දීමත් බෙහෙවින් සුදුසුය. එහෙත් වර්තමානයේ සිදු වන්නේ එම බලපත්‍රය දිනකින් හෝ දෙකකින් ලබා ගැනීමට කටයුතු කිරීමකි. පිටපත ඉදිරිපත් කිරීම බොහෝ විට සිදු වුවත් ඇතැම් අවස්ථාවල ඒ පිළිබඳව අයදුම්කරු උනන්දුවක් නොදක්වන අවස්ථා අපි අත්දැක ඇත්තෙමු.

සමහර නිශ්පාදකවරු රූගත කිරීම් සඳහා ක්ෂේත්‍රය වෙත ගොස් අනතුරුව මේ සඳහා ඉල්ලුම් කරන අවස්ථාද බහුලය.මෙයින් මනාවපැහැදිලි වන්නේ ඔවුන්ගේ නොසැලකිල්ල හා තම දේශයේ පුරාවිද්‍යා උරුමය පිළිබඳ ව ඔවුන් තුළ පවතින අඩු තක්සේරුවයි.

එහෙයින් ඉල්ලුම් කිරීමට නිශ්චිත ආකෘති පත්‍රයක් සකසා තිබීම මෙන් ම පිටපත ඉදිරිපත් කිරීම අනිවාර්ය කිරීමටත්, එය අධ්‍යයනය සඳහා සති දෙකක පමණ කාලයක් නිශ්චිතව දැක්වීමටත්, ඔවුන් අතින් පුරාවිද්‍යා ස්ථානයට යම්කිසි හානියක් වුවහොත් ඒ සඳහා දැඩි නීති අනුගමනය කිරීමත් යුගයේ දැඩි අවශ්‍යතාවක්ව පවතින බව අවධාරණය කරමි.

**Bibiliography**

Biswas, Sachindra sekhar (1999) *Protecting the Cultural Heritage National Legislations And Internatinal Conversations*, Aryan Books International, New Delhi.

Ghosh. A, 1958, "Notes Ancient India", No. 14 New Delhi.

Sarkar, H.*Museums and Protection of Monuments and Antiquities in India.*

The Ancient Monuments and Archaeological Sites and

Remains Act, 1958 (24 of 1958), as amended by the ancient monuments and Archaeological Sites and Remains (Amendment and validation Act, 2010 10 of 2010), Universal Law publishing Co. Pvt, Ltd, New Delhi, India.

Interview with Dr. S.K.Mithra and Mr.Alloney of Archaeological Survay of India.


50 *The Ancient Monuments and Archaeological Sites and Remains Rules, 1959* [Sch. 3 Form VIII

**FORM IX**

**APPLICATION FOR LICENCE OF FILMING OPERATION AT A PROTECTED MONUMENT**

(*Vide* rule 43)

1. Name and address of applicant. (If the application is on behalf of an organisation, the name thereof should be given)

2. Name of the monument at which the proposed filming operation is to be carried out.

Locality..............................District..............................State..............................

3. Part of the monument proposed to be filmed.

4. Nature and purpose of the proposed filming operation and the context in which the monument is proposed to be filmed (relevant extract of the script should be attached in triplicate and details of the scenes to be filmed should be furnished in triplicate).

5. Number of persons in the cast.

6. Approximate duration and date of commencement of proposed filming operation.

I declare that the above information is correct. I also undertake to observe the provisions of the Ancient Monument and Archaeological Sites and Remains Act, 1958, and the rules made thereunder.

Seal of the organisation

Station......................

Date......................

Signature of applicant

(If the application is on behalf of an organisation, the signature should be that of the head of the organisation).

**FORM X**

**LICENCE FOR FILMING OPERATION AT A PROTECTED MONUMENT**

(*Vide* rule 44)

Whereas..............of..............has applied for a licence for filming operation at the protected monument known as..........located at.............., Distict.............., State.............., and has undertaken to observe the provisions of the Ancient Monuments and Archaeological Sites and Remains Act, 1958, and the rules made thereunder, I.........., Director-General of Archaeology, do hereby grant this licence under rule 44 of the said rules of said.......... for the carrying out of filming operation, as per script and details of scenes attached hereto, in the following parts of the monuments, namely:

The licnece is granted subject to the provisions of the said Act, and rules and is further subject to the following conditions, namely:—

The licnece is not transferable. It shall be valid for.......... commencing with day of.........19....../20......

Seal of the Department of Archaeology of the Government of India

Station......................

Date......................

Signature of Director-General of Archaeology

අධ්‍යක්ෂ ජනරාල් / Director-General
දුරකථන අංක / Telephone Nos : [illegible]
ෆැක්ස් / Fax : 011-2696250
E mail : archdg@diamond.lanka.net
Web site : [illegible]
විදුලි පණිවුඩ / Telegrams : Puravid.

# පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව
## தொல்லியல் திணைக்களம்
## DEPARTMENT OF ARCHAEOLOGY

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය
Government of the Democratic Socialist Republic of Sri Lanka

මගේ අංකය / My No. :
ඔබේ අංකය / Your No. :
Sir Marcus Fernando Mawatha,
Colombo 7.
දිනය / Date :

**සිතුවම් ඡායාරූප සහ වීඩියෝ ගත කිරීම සඳහා බලය**

ඔබගේ ........./......./....... දින දරණ ලිපිය සම්බන්ධයෙනි.

........................................................................................ යන පුරාවිද්‍යා රක්ෂිත/ස්මාරක හි වීඩියෝ ගත කිරීමට සහ ඡායාරූප ගත කිරීමට ........................................

........................................................................................

පහත කොන්දේසි යටතේ අවසර දෙමි.

**කොන්දේසි**

01. පුරාවිද්‍යා රක්ෂිතයන්හි / ස්මාරකයන්හි වීඩියෝ ගත කිරීමේ දී පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ බලයලත් නිලධාරියෙකු ඉදිරිපිටදී පමණක් කළ යුතු අතර, ස්මාරක යහපත සඳහා ඔහු විසින් පනවනු ලබන කොන්දේසි වලට අනුකූල විය යුතුය.
02. සිතුවම් ඉරියව් වලින් කිසිවකු ඔබගේ රූප රාමුවලට ඇතුලත් නොකළ යුතුය.
03. ඔබගේ රූපගත කිරීම් හේතුවෙන් පාරණි ස්ථානයට කිසිදු හානියක් නොකළ යුතු අතර, එසේ සිදු නොවීමට ද ඔබ විසින් වග බලා ගත යුතුය.
04. පුරාවිද්‍යා කෞතුකාගාරයක් ඇතුලත ඡායාරූප / වීඩියෝ ගත කිරීම නොකළ යුතුය.
05. දෙපාර්තමේන්තුව මගින් සංරක්ෂණ හා කැණීම් කරනු ලබන ස්ථාන රූපගත නොකළ යුතුය.
06. 1940 අංක පුරාවස්තු ආඥාපනතේ නො. 45, 46, 47 සහ 48 දරණ වගන්ති වලට මෙම බලපත්‍රය යටත්ය.
07. මේ යටතේ ලබා ගන්නා රූප රාමු ඡායාරූප කිසියම් වෙළඳ කටයුත්තකට හෝ ප්‍රකාශයකට, විකාශනයකට හෝ ප්‍රදර්ශනයකට ඇතුලත් කරන්නේ නම් ඊට ප්‍රථම එම නිශ්චිත අවස්ථා පිළිබඳ මෙම දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඊට ද අනුමැතිය ලබාගත යුතුය.
08. ඔබ විසින් ඉල්ලුම් කරන ලද කාරණයට අනුකූලව දෙනු ලැබූ මෙම බලය යටතේ ලබා ගන්නා රූපරාමු වෙනත් කාර්යයක් සඳහා යොදා නොගත යුතු අතර. එසේ ලබා ගන්නේ නම් ඒ සඳහා ලිඛිතව එයට ද අනුමැතියක් ලබා ගත යුතුය.
09. පුරාවිද්‍යා ස්මාරකයක් රූපගත කිරීමේ දී එම ස්මාරක භාරකරුගේ අනුමැතිය ඔබ විසින් ලබාගත යුතුය.
10. පුරාවිද්‍යා ස්මාරකයක් ගුවනේ සිට ඡායාරූප ගත කිරීමේ දී ගුවන් යානාව මීටර් 500 කට පහළින් පියාසර නොකළ යුතුය.
11. මෙම අවසරය අවශ්‍ය විටෙක අවලංගු කිරීමට පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල් හට හැකි අතර, ඊට කිසිදු වන්දියක් ගෙවීමට පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව බැඳී නොසිටී.
12. මෙම අවසරය .............................. සිට .............................. දක්වා දිනවල පෙ.ව. 8.00 සිට ප.ව. 5.00 දක්වා පමණක් වලංගුය.
13. ........................................................................................
........................................................................................

ජේ. ඩී. විජේතිලක
වැ. බ. අධ්‍යක්ෂ (පුරාවිධාන)
පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට

පිටපත් :
1. ප්‍රාදේශීය සහකාර අධ්‍යක්ෂ - දැ.ගැ.සි.
2. ස්ථාන භාර නිලධාරී (පුරාවිද්‍යා) - දැ.ගැ.සි.
3. මධ්‍යම සංස්කෘතික අරමුදල - දැ.ගැ.සි.
4. [illegible] - දැ.ගැ.සි.

පුරාවිද්‍යා මූලස්ථානය - පොදු අංක / Head Office – General Numbers : 011-2692840, 011-2692841
Police Unit – Prevention of Destruction and Theft of Antiquities : General 011-2694727, Hot Line 011-7 222 333